(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 22.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 19 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

152/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෙරවලපිටියේ පිහිටුවා ඇති කසල මගින් විදුලිය උත්පාදනය කරන විදුලි බලාගාරයේ (Waste-to-Energy Power Plant) උත්පාදනය කරනු ලබන විදුලිය ඒකකයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවනු ලබන මිල කොපමණද;

(ii) එම බලාගාරය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා දිනකට අවශ්‍ය වන කසල ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) 2024 වර්ෂය තුළ එම බලාගාරය වෙත දෛනිකව සපයනු ලැබූ කසල ප්‍රමාණයේ සාමාන්‍ය අගය මෙට්‍රික් ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරය සඳහා කසල සැපයීම සිදු කරනු ලබන පළාත් පාලන ආයතන කවරේද;

(ii) කසල දහනය කිරීමෙන් පසුව මේ වනවිට ඉහත බලාගාර පරිශ්‍රය තුළ එක්රැස් වී ඇති අළු ප්‍රමාණය කොපමණද;

(iii) බලාගාරයෙන් නිකුත් වන අළු පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ඉහත බලාගාරය සඳහා 2023 වර්ෂයට අදාළව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

179/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කරන ලද දිනය කවදාද;

(ii) රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන ලද කෙටි-කාලීන හා දිගු-කාලීන ණය මුදල්වල එකතුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලය තුළ සේවය කරන ස්ථිර හා අනියම් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වැටුප්, අතිකාල දීමනා, වෘත්තීයවේදී දීමනා, ප්‍රසාද දීමනා, ප්‍රවාහන වියදම් සහ වෙනත් කවර හෝ පාරිශ්‍රමික සඳහා දරන ලද මුළු මාසික පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු ගෙවන්නේද;

(iv) නොඑසේ නම්, එම ආයතනය උපයන විට ගෙවීමේ බදු ගෙවීම නැවැත්වූ දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

245/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර පාලනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘති අතරින් මේ දක්වා ක්‍රියාත්මක නොකර ඉතිරිව ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානුව, අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

257/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ 'හෝලුවගොඩ' සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත කෘෂිකාර්මික භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණය කෘෂිකර්මාන්ත කටයුතු සඳහා යොදා ගැනීමට මේ වනවිට ඇති බාධා කවරේද;

(iv) එම ව්‍යාපෘතිය වෙනුවෙන් මේ දක්වා කරන ලද වියදම් හා සංසන්දනය කිරීමේදී, එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

440/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගනය (නගර සභා ක්‍රීඩාංගනය) ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා යෝග්‍ය තත්ත්වයක නොපවතින බවත්;

(ii) එම ක්‍රීඩාංගනයේ ජලය බැස යාම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(iii) එහි ඉදිකර ඇති කානු පද්ධතිය හේතුවෙන් ක්‍රිකට් තරග පැවැත්වීමට නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා එම ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ක්‍රීඩාංගනයට සිදු වී ඇති හානි සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) බණ්ඩාරවෙල ප්‍රදේශයේ ක්‍රීඩකයන්ට සහ පාසල් සිසුන්ට භාවිතා කිරීමට හැකි වන පරිදි ඉහත ක්‍රීඩාංගනය නවීකරණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — (දෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 පෙබරවාරි 17) [1].

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.